

# ප්‍රීතිමත් කුමාරයා

The Happy Prince **Oscar Wilde**

From the book 'Happy Prince and Other Tales' by Oscar Wilde, first published in 1888 illustrated by Walter Crane

හෙල්මලී ගුණතිලක - පරිවර්තන

නගරයට ඉහළින්, උස කුළුණක මුදුනේ ප්‍රීතිමත් කුමාරයාගේ පිළිමය තිබුණා. ඔහුගේ මුළු සිරුර ම සිහින් රන් පත්‍රයෙන් අලංකාර කර තිබුණා. ඔහුගේ දෑසේ නිල් මැණික් දෙකක් දිලිසුණා, ඒවගේම කඩු මිටේ දීප්තිමත් ව පෙනුණේ රත් මැණිකක්.

හැමදෙනාම කුමාරයාව නිරතුරුව අගය කළා. "ඔහු සුළං දිශා දර්ශකයක් තරම් දැකුම්කලුයි" තමන්ට බොහොම කලාකාමී අදහස් තිබෙන බවට මතයක් ගොඩනඟන්නට කැමැත්තෙන් උන් නගර සභා නිලධාරියෙක් කීවා. "ඒත් එතරම්ම ප්‍රයෝජනවත් නම් නැහැ" ඒ එක්කම ඔහු කීවේ මිනිසුන් ඔහු ප්‍රායෝගික නැති කෙනෙක් යැයි වරදවා වටහා ගනී යැයි බියෙන්.

"ඇයි ඔයාට ප්‍රීතිමත් කුමරයා වගේ වෙන්න බැරි?" හඬ ඉල්ලමින් හඬන කුඩා දරුවෙකුගෙන් ඔහුගේ මව ඇසුවා. "ප්‍රීතිමත් කුමාරයා නම් කවදාවත් එක එක දේවල් ඉල්ලමින් කරන ඇඬිල්ලක් ගැන හීනෙකින් වත් හිතන්නේ නැහැ"

"මේ ලෝකේ එක්කෙනෙක් හරි බොහොම සතුටින් ඉන්න එක ලොකු දෙයක්" අලංකාර පිළිමය දෙස බලාගෙන උන් බලාපො- රොත්තු සුන්වූ මිනිසෙක් සෙමෙන් මිමිනුවා.

පිරිසිදු සුදු ඇඟලුම් සහ රත් පැහැති කබා පැළඳ සිටි අනත්දරු නිවසේ දරුවන් පල්ලියෙන් පිටවෙද්දී පිළිමය දැක "ඔහු දේවදූතයෙක් වගේ" කීවා.
"ඔයාලා කොහොමද දන්නේ? ඔයාලා දේවදූතයෝ දැකලා නැහැනේ" එය ඇසී ඔවුන්ගේ ගණිතය ගුරුවරයා ඔවුන්ගෙන් ඇසුවා.

"ආ අපි දැකලා තියෙනවා, හීනවල" ළමුන් පිළිතුරු දුන්නා. ළමුන් හීන දැකීම අනුමත නොකළ ගුරුවරයා එය අසා නපුරු බැල්මකින් රවා බැලුවා.

එක් රාත්‍රියකදී පුංචි ලිහිණියෙක් නගරයට ඉහළින් පියාසලමින් සිටියා. ඔහුගේ මිතුරෝ සියලු දෙනා ඊට සති හයකට කලින් ඊජිප්තුව බලා පියාසර කර තිබුණා. ඔහු ඔවුන් හා නොගොස් නතර වී තිබුණේ ඉතාම ලස්සන දිය තණ පඳුරක් හා ප්‍රේමයෙන් වෙලී උන් නිසායි. පළමුවරට ඈ ඔහුගේ නෙත ගැටුණේ වසන්ත කාලයේ මුලදී විශාල කහ පැහැති සලබයෙක් හඹාගෙන ගඟ පහළට ඉගිලෙද්දී. ඇගේ සිහින් ඉඟ දැක ඈ වෙත ආකර්ෂණය වූ ඔහු ඈ හා දොඩන්නට නතර වුණා.

කල් නොයවා අදාළ කාරණා ගැන කතාකරන්නට ප්‍රිය කළ ලිහිණියා, "මම ඔබට ප්‍රේම කරන්නද?" කියා ඇසූ විට තණ පඳුර හිස පහත් කර ඔහුට ඇගේ කැමැත්ත පෙන්වූවා. ඉතින් ඔහු පියාපත් දියෙහි ගාවමින්, රිදී රැළි නංවමින්, ඈ වටා කීප වරක් පියාසර කළා. ඔහුගේ මේ පේ්‍රම රංගනය මුළු ගිම්හාන කාලය පුරාවටම පැවතුණා.

"මේක නම් මහා විකාර සම්බන්ධයක්" අනෙත් ලිහිණින් කිචිබිචි ගෑවා. "ඈට කිසිම වස්තුවක් නැහැ, නෑදෑයෝත් වැඩියි." ඇත්තටම ඈ වැනිම තණ පඳුරු ගඟ පුරාම පෙනෙන්නට තිබුණා. සරත් කාලය එළඹුණු විට ලිහිණින් හැම දෙනාම ඉගිලී ඈතට ගියා.

ඔවුන් යන්නට ගිය පසු පුංචි ලිහිණියාට මහත් පාළුවක් දැනුණා. ඒ වගේම ඔහුගේ පෙම්වතිය ගැන නොරිස්සුමක් දැනෙන්න- ටත් වුණා. "ඇගේ කිසිම කතාබහක් නැහැ" ඔහු කීවා, "ඒ වගේම සුළඟ එක්ක අඟර දඟර පානවා වැඩියි". ඇත්තටම සුළඟ හැමූ හැම විටකම ඈ බොහොම සුන්දර ලෙස නැමී නැමී ආචාර කරනු පෙනුණා. "ඈ තරමක් ගෙදරට කොටු වූ කෙනෙක් බව මට තේරෙනවා" ඔහු තවදුරටත් කීවා. "ඒත් මම සංචාරයට ප්‍රිය කරන කෙනෙක්, ඒනිසා මගේ බිරිඳත් ඊට ප්‍රිය කළ යුතුයි"

"ඔබ එනවාද මා සමඟ යන්න?" ඔහු අවසාන වශයෙන් ඇගෙන් ඇසුවා. ඒත් දිය තණ පඳුර හිස සලා අකමැත්ත පළ කළේ ඈ ඇගේ නිවසට තදින්ම බැඳී උන් නිසායි.

"ඔබ මට ඔච්චම් කළා" එය දැක ඔහු කෑ ගැසුවා. "මම යනවා පිරමිඩ තියෙන පැත්තට!" එසේ කියා ඔහු ඉගිලී ගියා.

දවස පුරාම ඉගිලුණු ඔහු රෑ වෙද්දී නගරය වෙත ළඟා වුණා. "අද රෑට මම නවතින්නේ කොහේද? නගරය මා වෙනුවෙන් ලැහැස්ති වී ඇති කියලා මම හිතනවා"

ඔහු උස කුලුන මුදුනේ පිළිමය දුටුවේ එවිටයි.

"මම අද රෑට මෙතැන නවතින්නම්." ඔහු කීවා. "තැනත් හොඳයි, හොඳ වාතශ්‍රයකුත් තියෙනවා". එසේ කියූ ඔහු ප්‍රීතිමත් කුමාරයාගේ දෙපා මුල නතරවුණා.
"මට තියෙන්නේ රන් පැහැති නිදන කාමර- යක්" ඔහු වටපිට බලමින්, නිදාගන්නට සූදා- නම් වෙමින් තමාටම හෙමින් කියාගත්තා. ඒත් නින්දට කලින් තමන්ගේ හිස තටුව අස්සේ සඟවා ගන්නට යද්දී ලොකු දිය බිඳුවක් ඔහුගේ ඇඟට වැටුණා. "මේ නම් හරිම විශ්මයක්" ඔහු පුදුම වුණා. "අහසේ එකම වලාකුළක් වත් නැහැ, තරු බොහොම දීප්තිමත්ව දිලිසෙනවා, ඒත් මෙන්න වහිනවා! උතුරු යුරෝපයේ දේශගුණය නම් අන්තිමයි. දිය තණ පඳුර නම් වැස්සට හරි මනාපයෙන් උන්නා. ඒත් ඒ ඇගේ ආත්මාර්ථකාමී බව නිසා යි."

එවිටම තව දිය බිඳුවක් වැටුණා.

"වැස්සෙන් වත් හෙවණක් දෙන්න බැරි නම් පිළිමයකින් වැඩක් ඇතිද? හොඳ දුම් කවුළුවක් වත් හොයාගන්නට ඕනෑ" මෙසේ කියා ඔහු පියාපත් විදා ඉගිල යන්නට සැරසෙද්දී තුන්වෙනි දිය බිඳුවත් වැටුණා.

ඉහළ බැලූ ලිහිණියා දුටුවේ කුමක්ද?

ප්රීතිමත් කුමාරයාගේ දෑස කඳුළින් පිරී තිබුණු අතර ඔහුගේ රන් පැහැති කොපුල් හරහා කඳුළු ගලා යමින් තිබුණා. සඳ එළියේ දිස් වුණු ඔහුගේ මුහුණේ සුන්දර බව නිසා පුංචි ලිහිණියාට ඔහු ගැන මහත් අනුකම්පාවක් දැනුණා.

"ඔබ කවුද" ඔහු ඇසුවා
"මම ප්රීතිමත් කුමාරයා"
"එහෙනම් ඔබ වැලපෙන්නේ ඇයි?"
ලිහිණියා ඇසුවා; "ඔබ නිසා මම හොඳටම තෙමුණා"

"මිනිස් හදවතක් ඇතිව මා ජීවත්ව උන් කාලයේදී කඳුළු කියන්නේ මොනවාද කියාවත් මා දැනගෙන උන්නේ නැහැ" පිළිමය පිළිතුරු දුන්නා. "මම වාසය කළේ ශෝකයට ඇතුළුවීමට තහනම්ව තිබුණු සන්. සූසි මාලිගයේ. දිවා කාලයේදී මම මගේ සගයන් හා එක්ව උද්‍යානයේ ක්‍රීඩා කළා. සවස්වරු වලදී මම මහා ශාලාවේ නර්තනයන්ට නායකත්වය දුන්නා. උද්‍යානය වටා බොහොම උස් පවුරක් තිබුණත් ඉන් එපිට තිබුණේ මොනවාදැයි හොයන්නට මම කවදාවත් උනන්දු නොවුනේ මගේ ජීවිතය ඉතාම ලස්සනට තිබුණු නිසා යි. මගේ අමාත්‍යවරු මට කීවේ 'ප්‍රීතිමත් කුමාරයා' කියලා යි. සැපත කියන්නේ සතුට නම් මම ඇත්තටම සතුටින් හිටියේ. ඉතින් ඔය විදිහට මම ජීවත් වුණා, මැරිලා ගියා. දැන් මම මැරිලා නිසා ඒ අය මාව මේ උස් තැනක රඳවලා තියලා. මෙතැනට මගේ නගරයේ අවලස්සනත්, දුක්ඛිත බවත් හොඳට පේනවා. මගේ හදවත ඊයමින් තනා තිබුණත් වැලපෙනවා හැරෙන්නට මට කළ හැකි වෙන දෙයක් නැහැ"

"මොකක්? ඒ කියන්නේ මෙයා තනි රත්තරන් නෙමෙයි ද?" ලිහිණියා තමන්ටම කියාගත්තා. එහෙත් ඔහු ඉතා ආචාරශීලී නිසා එවැනි පෞද්ගලික දේ නොඅසන්නට ප්‍රවේසම් වුණා.

"බොහොම දුර ඈතක" පිළිමය සෙමෙන්, ගීතවත් හඬකින් තවදුරටත් කියන්නට වුණා. "බොහොම දුර ඈත කුඩා පාරක එක්තරා දුප්පත් ගෙදරක් තිබෙනවා. ඒ ගෙදර එක කවුළුවක් විවරවයි තිබෙන්නේ, එයින් මට පේනවා මේසයක් අසල වාඩිවී සිටිනා කාන්තාවක්. ඇගේ මුහුණ ඇදී ගිහින්, ඈට හරි වෙහෙස පාටයි. ඈ ඇඳුම් මසන්නියක් නිසා ඇගේ දෑත ඉඳිකටු ඇනීමෙන් රත් පැහැ ව, රළු ව පෙනෙනවා. රැජිනගේ ලස්සනම පරිවාර කාන්තාව ඊළඟ රාජකීය නැටුමට අඳින්නට නියමිත සැටින් ගවුමේ මල් මසමිනුයි ඇය සිටින්නේ. ඒ කාමරයේ කෙළවරක ඇගේ පුංචි පුතා අසනීපයෙන් වැතිරී ඉන්නවා. උණක් වැළඳී සිටින ඔහු දොඩමි ඉල්ලමින් හඬනවා. ඒත් ඔහුගේ අම්මාට ගඟෙන් ගත් ජලය මිසක් ඔහුට දෙන්නට වෙනත් දෙයක් නැහැ. ඒ නිසා ඔහු හඬමින් ඉන්නේ. පුංචි ලිහිණියෝ පුංචි ලිහිණියෝ, මගේ කඩුවේ කොපුවේ ඇති රත් මැණික ඇයට දෙන්නට බැරිද? මගේ දෙපා මේ පාදමට සවිවෙලා නිසා මට හෙලවෙන්නට බැහැ"

"ඊජිප්තුවේ කට්ටිය මම එනතුරු මඟ බලාගෙන ඉන්නේ." ලිහිණියා කීවා. "මගේ යහළුවෝ නයිල් ගඟේ ඉහළ පහළ පියාඹමින් විශාල නෙළුම් මල් එක්ක කතා කරමින් ඇත්තේ. ඉක්මනින්ම ඒ අය උතුම් රජුගේ සොහොන්ගෙයි නිදන්නට යාවි. ඒ රජු එතැන තීන්ත ආලේපිත මිනී පෙට්ටියක සැතපිලා ඉන්නවා. ඔහුගේ සිරුර කහ පැහැති මුදු රෙදිවලින් ඔතා කුළුබඩු වර්ගවලින් සුවඳ කවාලායි තිබෙන්නේ. ඔහුගේ ගෙල වටා පච්ච වර්ණ ගලින් සැදුණු මාලයක් පළඳවා තිබෙනවා. ඔහුගේ දෑත් පරඬැල් වගේ."

"පුංචි ලිහිණියෝ, පුංචි ලිහිණියෝ" කුමාරයා කීවා. "ඔබට බැරිද මාත් එක්ක එක රැයක් ගතකරලා මගේ පණිවිඩකරු වෙන්න? අර පුංචි දරුවාට හරිම තිබහයි, ඒ අම්මාට හරි දුකයි"

18 වන පිටට